# පුරාතන ලංකාවේ චරපුරුෂ සේවයේ ස්වභාවය

පී. ඒ. පී. එල්. ඩී ප්‍රේමරත්න
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
lakmali.dhananji10@gmail.com

**සංක්ෂේපය**

දුරාතීතයේ සිටම බොහෝ රජවරුන් තම රාජ්‍යයේ පාලනය සාර්ථක ලෙස පවත්වාගැනීම සඳහා පාලන තන්ත්‍රයේ එක් අංගයක් ලෙස චරපුරුෂ සේවය පවත්වා ගැනීම දැකගත හැකිය. මෙහිදී බොහෝ රජවරුන් චරපුරුෂ සේවය ආරක්ෂක සංවිධානයේ එක් අංගයක් ලෙසට යොදාගනු ලැබුවේ විවිධ හේතුකාරණා මතය. සතුරා විසින් තමන්ට විරුද්ධව ක්‍රියාත්මක කරන යුධ සැලසුම් පිළිබඳව දැනගැනීමටත්, යුද්ධ සමයේදී සතුරාගේ බලකොටු කඳවුරු හා මධ්‍යස්ථාන පිහිටි තැන් පිළිබඳවත්, ඒ ඒ ස්ථානවලට ඇතුළුවිය හැකි මාර්ග දොරටු, විශේෂයෙන් රහසිගත මාර්ග පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම සේවය යොදාගෙන තිබේ. මෙහිදී ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීය මූලාශ්‍රය භාවිතා කෙරිණි.

චරපුරුෂ සේවයක අගය වඩාත් කැපී පෙනෙන්නේ රටක යුද්ධයක් පවතින අවස්ථාවකදීය. සතුරාගේ හමුදා ශක්තිය, භාණ්ඩාගාරය සහ යුද්ධෝපකරණවල ප්‍රමාණය පිළිබඳව මනා වැටහීමකින් තොරව යුද්ධයක් ජයගැනීම පහසුකාර්යයක් නොවීම ඊට හේතුවයි. මේ තත්ත්වයන් නිසා සෑම කල්හිම සෑම රටකම පාහේ පාලකයන් සංවිධානාත්මක චරපුරුෂ සේවාවක් නොවුවත්, චරපුරුෂයන් කිහිප දෙනෙකු හෝ තබා ගැනීමට කටයුතුකර ඇත.

මූලාශ්‍රයගත කරුණුවලට අනුව රජවරුන් බොහොමයක් චරපුරුෂ සේවය යොදාගෙන ඇති බව පැහැදිලි වේ. මෙහි දී ප්‍රධාන වශයෙන් අවධානය යොමුවන්නේ චරපුරුෂයන් තම ඔත්තු සේවාව සාර්ථක කරගැනීමට යෙදූ උපක්‍රම පිළිබඳවයි. රජවරුන් තම රාජ්‍ය ස්ථාවර කරගැනීම සඳහා චරපුරුෂ සේවය යොදාගැනීම එක් යුධ උපක්‍රමයක් ලෙස නිගමනය කළ යැකිය.

**ප්‍රමුඛ පද:- චරපුරුෂ සේවය, රජවරුන්, රාජ්‍ය**